රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government
ඉංජිනේරු සේවා අංශය, பொறியியல் சேவைப் பிரிவு, Engineering Services Division
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකා. சுதந்திரச் சதுக்கம் கொழும்பு 07 இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.
Website : www.pubad.gov.lk

දුරකතන / தொலைபேசி / Telephone } 011-2696211-13
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail } info@pubad.gov.lk

මගේ අංකය / எனது இல / My No } MPA/ESD/14/01/09/2024
ඔබේ අංකය / உமது இல / Your No }
දිනය / திகதி / Date } 2024.07.17

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

**<u>ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හා තනතුරුවලට පත් කිරීම</u>**

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ විශේෂ ශ්‍රේණියේ 2024.07.01 දිනට පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව ඔබ, අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / පළාත් සභාවේ සේවයේ නියුතු ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්පත් කැඳවීමේ නිවේදන හා ආදර්ශ අයදුම්පත්‍ර පහත පරිදි ඔබ වෙත ඉදිරිපත් කරන අතර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඔබේ නිර්දේශය සහිතව 2024.08.02 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පලාන අමාත්‍යාංශයේ ඉංජිනේරු සේවා අංශය වෙත ලැබීමට සලස්වන ලෙස නිලධාරීන් දැනුවත් කරන්නේ නම් මැනවි.

03. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයෙහි ප්‍රගමන පිටපතක් esbpubad@gmail.com යන විද්‍යුත් තැපෑලටද යොමු කළ යුතුය. එමෙන්ම මගේ අංක MPA/ESD/14/01/07/2023 හා 2023.12.04 දිනැති ලිපියට අනුව මේ වන විට පශ්චාත් උපාධි / පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතික තහවුරු කර ගැනීම සඳහා ඉදිරිපත් කර නොමැති නිලධරයන් තම පශ්චාත් උපාධි / පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතික වල සහතික කල පිටපත් තහවුරු කර ගැනීම සඳහා මෙම අමාත්‍යාංශයේ ඉංජිනේරු සේවා අංශය වෙත නොපමාව භාරදීමට කටයුතු කළ යුතුය.

04. 2024.08.02 දිනට පෙර සිය අයදුම්පත්‍ර අදාළ ආකෘතිය පරිදි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබීම සඳහා සලකා බලනු නොලැබේ.

05. අයදුම්පත් කැඳවීමේ නිවේදනවල හා අදාළ ආදර්ශ අයදුම්පත්‍රයෙහි මෘදු පිටපත් මෙම අමාත්‍යාංශ වෙබ් අඩවියේ මුල් පිටුවේ “ **වෙනත් නිවේදන** ” යටතේ මෙන්ම පහත දිගුව ඔස්සේද ලබා ගත හැක.
www.pubad.gov.lk → සේවා → ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය → ඇබෑර්තු ලේඛනය → විශේෂ ශ්‍රේණිය

**ප්‍රදීප් යසරත්න**
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත්
සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන / ෆැක්ස් : 011- 2698268
විද්‍යුත් තැපැල් ලිපිනය : esbpubad@gmail.com

ඇමුණුම 01

<u>අයදුම්පත් කැඳවීමේ නිවේදනය</u>

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයෙහි I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම.

අංක 1836/6 හා 2013.11.11 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අංක 2190/26 හා 2020.08.25 දිනැතිව කරන ලද 6 වන සංශෝධනයෙහි හා අංක 2233/27 හා 2021.06.23 දිනැතිව කරන ලද 7 වන සංශෝධනයෙහි හා අංක 2303/04 හා 2022.10.25 දිනැතිව කරන ලද 8 වන සංශෝධනයෙහි විධිවිධාන අනුව 2024.07.01 දිනට විශේෂ ශ්‍රේණියේ අනුමත තනතුරු සංඛ්‍යාවේ පවත්නා පහත පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලැබූ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පහත සඳහන් තනතුරු වලින් 01 ක් හෝ කිහිපයක් නොපුරවා තැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත බලය ඇත.

| අනු අංකය | විශේෂ ශ්‍රේණියේ තනතුර | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | අයත් කාණ්ඩය |
|---|---|---|---|
| 1. | අධ්‍යක්ෂ ජනරාල් (නිවාස හා ඉදිකිරීම්) | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය | සියළුම සිවිල් |
| 2. | අතිරේක ලේකම් (ඉංජිනේරු) | අධ්‍යාපන අමාත්‍යාංශය | සියළුම සිවිල් |
| 3. | අතිරේක ලේකම් (ඉංජිනේරු) | ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය | සියළුම සිවිල් |
| 4. | අතිරේක සාමාන්‍යාධිකාරී (යටිතල පහසුකම්) | දුම්රිය දෙපාර්තමේන්තුව | සිවිල් 4 |
| 5. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) | ඌව පළාත් සභාව | සිවිල් 7 |
| 6. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) | දකුණු පළාත් සභාව | සිවිල් 7 |

02. **විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම්**

i. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ පළමු ශ්‍රේණියේ වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ I ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහක් (05) උපයාගෙන තිබීම.

ii. උසස් වීම සඳහා සුදුසුකම් ලබන දිනට ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ වසර 18 කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. උසස් වීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා සභා චක්‍රලේඛ 1/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

v. **(අ.)** ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ අධි සාමාජිකත්වය ලබා තිබීම හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් වෙනත් ඉංජිනේරුමය ආයතනයකින් ලබාගත් ඊට සමාන අධි සාමාජිකත්වය ලබා තිබීම. මෙහිදී වරලත් ඉංජිනේරු තත්ත්වය ලැබූ ඉංජිනේරු ක්ෂේත්‍රයේම අධි සාමාජිකත්වය ලබා එම සාමාජිකත්වය අඛණ්ඩව පවත්වාගෙන යාම අනිවාර්ය අවශ්‍යතාවයකි.

**හෝ**

**(ආ.)** මාස 09 කට නොඅඩු පාඨමාලා කාලයක් සහිත ඉංජිනේරු ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා / පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කිරීම හෝ කළමනාකරණ ක්ෂේත්‍රයේ හෝ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි සහතිකය ලබා තිබීම සමග වරලත් ඉංජිනේරු තත්ත්වය අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබීම.

සටහන :

i. අධි සාමාජිකත්වය ලබාගෙන ඇත්තේ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයට (IESL) පරිබාහිර ආයතනයකින් නම්, එම අධි සාමාජිකත්වය ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් එකක් බවට සනාථ කිරීම සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය මගින් නිකුත් කරන ලද ලිපියක් ඉදිරිපත් කල යුතුය.

ii. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ අධි සාමාජිකත්වයට අදාල සහතිකයේ සහතික කල පිටපතක් ඉදිරිපත් කල යුතුය.

iii. අධි සාමාජිකත්වය අඛණ්ඩව පවත්වාගෙන යන බවට ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය නිකුත් කල ලිපියක් ඉදිරිපත් කල යුතුය.

03. **උසස් කිරීමේ ක්‍රමය**

3.1 සේවා ව්‍යවස්ථාවට අංක 2303/04 හා 2022.10.25 දිනැති ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද 8 වන සංශෝධනය පරිදි 10.3.2 සහ 11.3 (ඇ) ඡේදයන්ට අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි ජ්‍යෙෂ්ඨතාවය මත පදනම්ව උසස්වීම් සිදු කරන බැවින්**, <u>රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින්</u>** ජ්‍යෙෂ්ඨතාවය මත පදනම්ව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා හා අයදුම්කරුවන් ඉල්ලුම්කර ඇති තනතුරු වලට ඔවුන්ගේ මනාපයේ අනුපිළිවෙල සැලකිල්ලට ගෙන ජ්‍යෙෂ්ඨතමයාට ප්‍රමුඛතාවය ලැබෙන පරිදි එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින්ම නිර්දේශයන් ඉදිරිපත් කරනු ලැබේ.

3.2 එකී සම්මුඛ පරීක්ෂණය සඳහා 2024.07.01 දිනට පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වශයෙන් ගැනෙන සංඛ්‍යාව නොඉක්මවන 10.3.1 හි සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

3.3 ශ්‍රී ලං.ඉං.සේ. I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ අනුපිළිවෙල අනුව නිලධරයන් විශේෂ ශ්‍රේණියේ පවතින පුරප්පාඩුවලට උසස් කිරීම සිදු කරනු ලබන අතර 2024.07.01 දිනට අදාල විශේෂ ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨතා ලේඛනය, එම දිනට උසස් වීමට සුදුසුකම් ලැබූ නිලධාරීන් උසස් වීමට පෙර පැවති ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙලින් සැකසේ.

3.4 යම් හෙයකින්, 2024.07.01 දිනට ඉහත යම් තනතුරකට උසස් වීම් ලබා දීමට නොහැකි වුවහොත්, එම තනතුර / තනතුරු 2025.01.01 දිනට පුරප්පාඩු වූ තනතුරක් ලෙස සලකා කටයුතු කරනු ලැබේ.

04. සියලුම පුරප්පාඩු ගණනය කරනු ලබන්නේ එක් එක් වර්ෂයේ ජනවාරි 01 වන දිනට සහ ජූලි 01 වන දිනට බැවින් සියලුම අයදුම්කරුවන් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ දක්වා ඇති පුරප්පාඩු ගණනය කරනු ලබන දිනට උක්ත 02 ඡේදයෙහි සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය. මේ සමඟ වන ආකෘතියට අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත අමාත්‍යාංශ ලේකම්වරුන්, ප්‍රධාන ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් මා වෙත **2024.08.02** දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය. එදිනට පසුව එවන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාරගනු නොලබන අතර සදොස්ව හා අසම්පූර්ණව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි පිළිබඳ සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

05. ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇත්නම් පමණක්, අයදුම්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කරන මෙන් දන්වා සිටිමි. තවද, දැනට විශ්‍රාම ගෙන සිටියේ වුවද, පුරප්පාඩු ඇති වූ දිනට ඉහත අංක 03 හි සඳහන් සුදුසුකම් සපුරා සිටියේ නම්, තමා විශ්‍රාම යන දිනට පෙර දිනයක ඇති වූ පුරප්පාඩු සඳහා අයදුම් කළ හැකිය.

06. යම් නිලධරයෙක් විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබීමෙන් පසුව කරනු ලබන පත් කිරීම අනුව රාජකාරි භාරගැනීමට අපොහොසත් වුවහොත් ඒ සම්බන්ධයෙන් අංක 01/2021 හා 2021.06.30 සහ 01/2021(i) හා 2021.08.02 සහ 01/2022 හා 2022.02.28 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

07. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

"රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි"

**ප්‍රදීප් යසරත්න**
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

2024.07.17 දින.

දුරකථන අංකය / ෆැක්ස් : 011 2698268
විද්‍යුත් තැපැල : esbpubad@gmail.com

ඇමුණුම 02

කාර්යාලීය ප්‍රයෝජනය පිණිසයි
අයදුම්පත් අංකය [ ]

**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයෙහි I ශ්‍රේණියේ නිලධාරීන්**

**විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම් පත්‍රය** (2024.07.01)

**(අ) කොටස - නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය.**

| අයදුම් කරනු ලබන විශේෂ ශ්‍රේණියේ තනතුර | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | තනතුර අයත් කාණ්ඩය | මනාපය |
|---|---|---|---|
| | | | **1** |
| | | | **2** |
| | | | **3** |
| | | | **4** |
| | | | **5** |

1. නම :

1.1 මුලකුරු සමඟ නම :- ……………………………........……………………………..........………

1.2 සම්පූර්ණ නම :-……………..………………………….……………………….……………… ..….
……………………………….……….…………….……………….…………….…..........මෙය/මිය/මයා

1.3 පත්වීම් ලිපියෙහි සඳහන් නම : ..…………………………………………….........………….......
…….….....................................................(මුල් පත්වීම් ලිපියෙහි සහතික කල පිටපතක් ඇමිණිය යුතුය.)

2. ජාතික හැඳුනුම්පත් අංකය :.……………………….....…………………………...( ජාතික හැඳුනුම්පතෙහි සහතික කල පිටපතක් ඇමිණිය යුතුය)

3. උපන් දිනය : වර්ෂය …………… මාසය……….....…… දිනය………………

4. පෞද්ගලික ලිපිනය :.………………………..……........………………………………………
…………………………………………………………………………………………………………

5. දුරකථන අංකය - 5.1 ස්ථාවර : ...................................5.2 ජංගම : ............................

6. විද්‍යුත් තැපෑල : ……………………………………………………………………………………

7. 7.1 තනතුර : ……………………………………………………………………..

(දැනට දරන / දැනට විශ්‍රාමික නම් විශ්‍රාම යන අවස්ථාවේදී දැරූ)

7.3 එම තනතුරට පත් වූ දිනය : .....................................

7.2 දැනට විශ්‍රාමික නම් විශ්‍රාම ගත් දිනය : ......................................

8. ශ්‍රී ලං.ඉං.සේ. ඔබ අයත් වන කාණ්ඩය : ..................................

9. දැනට සේවය කරන ස්ථානය (අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / පළාත් සභාව) : .........…………
…………………………..............................................................................................................

10. කාර්යාලීය ලිපිනය : ……………………………………………………………………………….

11. 11.1 කාර්යාලීය දුරකථන අංකය : …………………………….…………………………

11.2 කාර්යාලීය ෆැක්ස් අංකය : ……………………………………………………………

12. දැනට දරණ පත්වීමේ ස්වභාවය (ස්ථිර/ වැඩබලන/කොන්ත්‍රාත් පදනම) : .............................

12.1 පත් කිරීමේ බලධාරියා (රා.සේ.කො./ අමාත්‍ය මණ්ඩල/ රේඛීය අමාත්‍යාංශය/ පළාත් සභා)

..................................................

13. පත්වීම් / උසස්වීම් දින -

13.1 ශ්‍රී ලං.ඉං.සේ. II/II ශ්‍රේණියට (III ශ්‍රේණියට) පත්වීම් දිනය : ………………………

13.2 ශ්‍රී ලං.ඉං.සේ. II/I ශ්‍රේණියට (II ශ්‍රේණියට) උසස්වීම් දිනය : ……………………….

13.3 ශ්‍රී ලං.ඉං.සේ. (I පන්තියට) අධි සේවක පදනම මත උසස්වී ඇත්නම් එම දිනය : .....................

13.4 ශ්‍රී ලං.ඉං.සේ. (I ශ්‍රේණියට) නිත්‍ය පදනම මත උසස්වීම් දිනය : ………...……….......

13.5 ශ්‍රී ලං.ඉං.සේ. I ශ්‍රේණියට උසස් වීම/අන්තර්ග්‍රහණය වූ දිනය : ……....……….........

( I ශ්‍රේණියට / I පන්තියට උසස්වීම් ලිපියේ සහතික කළ පිටපත 13.4 වශයෙන් අංක කර ඇමිණිය යුතුය.)

14. **I ශ්‍රේණියට උසස් වීමෙන් පසු සේවයේ නොසිටි කාල සීමාවන් සහ විනයානුකූල දඬුවම් ලැබීම මත සේවා කාලය අඩුවීම් -**

14.1 නිවාඩු ලබා ගැනීම මත සේවා කාලය අඩුවීම (අදාළ වේ නම් පමණක් සම්පූර්ණ කරන්න)

| අනු අංකය | නිවාඩු අනුමැතිය සඳහා අදාළ කොන්දේසි | කාල සීමාව | | සේවා කාලය අඩුවන දින ගණන | | |
|---|---|---|---|---|---|---|
| | | සිට | දක් වා | අවු: | මාස | දින |
| i | ආයතන සංග්‍රහයේ V:2.5.4 | | | | | |
| ii | ආයතන සංග්‍රහයේ XII:16 | | | | | |
| iii | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 10 | | | | | |
| iv | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 | | | | | |
| v | ආයතන සංග්‍රහයේ XII:36 | | | | | |
| vi | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 | | | | | |
| vii | වෙනත් වැටුප් රහිත නිවාඩු | | | | | |
| සේවා කාලය අඩුවන සම්පූර්ණ දින ගණන | | | | | | |

(නිවාඩු අනුමත කළ ලිපි වල සහතික කළ පිටපත් 14.1.i, 14.1.ii, 14.1.iii ආදී වශයෙන් කරුණට අදාළව අංක කර ඇමිණිය යුතුය.)

14.2 විනය කරුණු මත සේවා කාලය අඩු වීම (අදාළ වේ නම් පමණක් සම්පූර්ණ කරන්න)

| විනය තීරණය | චෝදනා පත්‍රය අනුව වරද සිදුවූ කාල සීමාව | සේවා කාලය අඩුවන දින ගණන | | |
|---|---|---|---|---|
| | | අවු: | මාස | දින |
| i . වැටුප් වර්ධක .........ක් විලම්භනය කිරීම | | | | |
| ii . වෙනත් | | | | |
| සේවා කාලය අඩුවන සම්පූර්ණ දින ගණන | | | | |

(විනය තීරණ වල සහතික කළ පිටපත් 14.2.i, 14.2.ii ආදී වශයෙන් කරුණට අදාළව අංක කර ඇමිණිය යුතුය.)

14.3 ඉහත 14.1 හා 14.2 හි මුළු එකතුව : අවු. ............ මාස .......... දින .............

14.4 ඉහත 13.4 හි සඳහන් I ශ්‍රේණියට පත්වූ දින සිට 2024.07.01 දක්වා සේවා කාලයෙන් ඉහත 14.3 හි කාල සීමාව ඉවත් කල විට ඉතිරි සේවා කාලය : වර්ෂ ............. මාස ................ දින ..............

14.5 ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ වසර 05 සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර I ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහක් (05) උපයාගෙන <u>තිබේ/ නැත</u>.*

*(අදාළ නොවන වචනය කපා හරින්න) (වැටුප් වර්ධක පත්‍රිකා පහේ (05)සහතික කළ පිටපත් 14.5.i, 14.5.ii ආදී වශයෙන් අංක කර ඇමිණිය යුතුය.)

15.0 **රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 1/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවම් නොමැති වීම**

15.1 පෞද්ගලික ලිපි ගොනුව අනුව, උසස් වීමට සුදුසුකම් ලබන දිනට පෙර වසර 05 තුළ කිසිඳු විනය දඬුවමකට ලක් වී තිබේද? (දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මේ බව ලිඛිත ප්‍රකාශයකින් සහතික කළ යුතුය - ඉල්ලුම්පතෙහි “ආ” කොටස යටතේ)

15.2 ඉහත 15.1 හි සඳහන් කාලසීමාව තුල විනය දඬුවමකට ලක්ව ඇති අතර 14.2 යටතේ කරුණු සඳහන් කර ඇත්නම් සහ ඒ අනුව උසස් වීම් දිනය සංශෝධනය වේ නම් එම දිනය : ..............................

16.0 උසස් වීම සඳහා සුදුසුකම් ලබන දිනට පෙර වසර 05 තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඊට ඉහල මට්ටමක පැවතීම. <u>ඇත / නැත *</u>

ඉහත 15.0 අනුව සුදුසුකම් ලබන දිනට අදාල වර්ෂයට පෙර වර්ෂ 05 පහත වගුවෙහි පලමු තීරුවේ සටහන් කල යුතුය. අදාල කාර්ය සාධන වාර්තා 05 හි සහතික කල පිටපත් ඇමිණිය යුතුය. කාර්ය සාධන වාර්තාවේ අවසාන ඇගයුමෙහි විකල්ප නිර්දේශ එකකට වඩා දක්වා ඇති සහ අදාළ නිලධාරියාගේ අත්සන හා නිල මුද්‍රාව තබා නොමැති වාර්තා පිළිගනු නොලැබේ.

| වර්ෂය | අවසාන ඇගයුම<br>විශිෂ්ඨයි / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළයි / සතුටුදායකයි / අසතුටුදායකයි | අදාළ නිලධාරියා අත්සන් තබා ඇත / නැත |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

එක් එක් වර්ෂයේ කාර්ය සාධන වාර්තාව අනුව සෑම පේළියක් හා තීරුවක්ම සම්පූර්ණ කළ යුතුය. (කාර්ය සාධන වාර්තා පහේ (05)සහතික කළ පිටපත් 16.i, 16.ii ආදී වශයෙන් අංක කර ඇමිණිය යුතුය.)

17.0 ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ අධි සාමාජිකත්වය ලබා තිබීම හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් වෙනත් ඉංජිනේරුමය ආයතනයකින් ලබාගත් ඊට සමාන අධි සාමාජිකත්වය ලබා තිබීම.මෙහිදී වරලත් ඉංජිනේරු තත්වය ලැබූ ඉංජිනේරු ක්ෂේත්‍රයේ ම අධි සාමාජිකත්වය ලබා එම අධි සාමාජිකත්වය අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇත / නැත *

එසේ නොමැති නම්,

මාස 09 කට නොඅඩු පාඨමාලා කාලයක් සහිත ඉංජිනේරු ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා / පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කිරීම හෝ කළමනාකරණ ක්ෂේත්‍රයේ හෝ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි සහතිකය ලබා තිබීම සමග වරලත් ඉංජිනේරු තත්ත්වය අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇත / නැත *

| 17.1 | 17.2 | 17.3 | 17.4 | 17.5 | 17.6 | 17.7 |
|---|---|---|---|---|---|---|
| අනු අංකය | පශ්චාත් උපාධි ඩිප්ලෝමාවේ/ පශ්චාත් උපාධියේ නම | විෂය ක්ෂේත්‍රය | එම උපාධිය/ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව පිරිනමන ලද ආයතනය/ විශ්ව විද්‍යාලය | එම ආයතනය / විශ්ව විද්‍යාලය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගෙන තිබේද යන වග | පශ්චාත් උපාධි/ උපාධි ඩිප්ලෝමා කාල සීමාව (ආරම්භක හා අවසාන දිනය) | පශ්චාත් උපාධි/ උපාධි ඩිප්ලෝමාව වලංගු දිනය |
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |
| 4. | | | | | | |
| 5. | | | | | | |

(17.1 වශයෙන් අංක යොදා උපාධි සහතිකය සහ විස්තරාත්මක ප්‍රතිඵල සටහනෙහි සහතික කළ පිටපත් ඇමිණිය යුතුය.) *(අදාළ නොවන වචනය කපා හරින්න)

18.0 උසස් වීම සඳහා සුදුසුකම් ලබන දිනට ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ වසර 18 කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇත. / නැත.*
*(අදාළ නොවන වචනය කපා හරින්න)

ඉහත අංක 01 සිට 18 තෙක් නිරවද්‍ය හා සම්පූර්ණ තොරතුරු සහිත ඉල්ලුම්පත සහ අමුණා එවන ලෙස සඳහන් කර ඇති සියළු ලේඛන වල සහතික කළ පිටපත් කරුණට අදාළ අංකය එක් එක් ලේඛනයේ දකුණු ඉහළ කෙළවරෙහි සටහන් කර **අංක පිළිවෙලින් අමුණා ගොනුවක් වශයෙන් සකස් කර**, මේ සමඟ ඉදිරිපත් කරමි. තවද විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබීමෙන් පසුව කරනු ලබන පත්කිරීම අනුව රාජකාරි භාරගැනීමට අපොහොසත් වුවහොත්, ඒ සම්බන්ධයෙන් අංක 01/2021 හා 2021.06.30 හා 01/2021(i) හා 2021.08.02 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරනු ලැබීමට යටත් වන බවද දනිමි.

දිනය : ……………………..

……………………………………
ඉල්ලුම්කරුගේ අත්සන
තනතුරු නාමය සහ නිල මුද්‍රාව

**<u>(ආ) කොටස - දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පෞද්ගලිකව සම්පූර්ණ කළ යුතුය.</u>**

ලේකම්/ ප්‍රධාන ලේකම්,

.............................................................................................. අමාත්‍යාංශය / රාජ්‍ය අමාත්‍යාංශය/පළාත් සභාව

1. නිලධාරියා විසින් ඉහත සඳහන් කර ඇති සියළු කරුණු නිවැරදිය.

2. අංක 13, 14, 15, 16, 17, හා 18 ට අදාළ කරුණු ගොනුව අනුව සසඳා බලන ලදී. සඳහන් කර ඇති කරුණු නිවැරදි බවද සියළු තොරතුරු සම්පූර්ණව ඉදිරිපත් කර ඇති බවද අදාළ සියළු ලේඛන වල **<u>සහතික කළ</u>** පිටපත් අමුණා ඉදිරිපත් කර ඇතිබවද සහතික කරමි.

**3.** නිලධාරියාට එරෙහිව විනය කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරමින් හෝ **<u>විනය පරීක්ෂණ සිදු වෙමින් පවතියි / නොපවතියි *</u>**

3.1 ඉහත පිළිතුර ''පවතියි'' නම් වරද කළ දිනය : .......................................

3.2 විනය බලධාරියා විසින් චෝදනා පත්‍රය නිකුත් කළ දිනය : ..................................

4. .......................................................................................... මහතා / මහත්මිය / මෙනවිය ගේ රාජකාරි / පැමිණීම / හැසිරීම සතුටුදායකය. ඔහුගේ / ඇයගේ කාර්යසාධනය, නායකත්වය, හැකියාව හා ඊළඟ උසස් වීමට අදාළව තනතුරු හා වගකීම් දැරීමේ හැකියාව සලකා බැලීමි. ඔහු / ඇය ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි / නොකරමි.*

**5.** නිවැරදිව, අනූනව සම්පූර්ණ කල **අයදුම්පතද,** එක් එක් කරුණට අදාළ අංකය සටහන් කරමින් අංක පිළිවෙළින් **අදාළ ලේඛන වල සහතික කළ පිටපත් ද අමුණා සකස් කරන ලද ගොනුව මේ සමඟ එවමි.**

දිනය : .................................        ...............................................................

දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ
අත්සන, තනතුරු නාමය
සහ නිල මුද්‍රාව

සටහන : නොගැළපෙන වචන කපා හරින්න.

**(ඇ) කොටස - අදාළ අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ පළාත් සභාවේ ප්‍රධාන ලේකම් විසින් පෞද්ගලිකව සම්පූර්ණ කළ යුතුය.**

ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

1. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ ............................................... මහතා / මහත්මිය / මෙනවිය ගේ රාජකාරි හා හැසිරීම පිළිබඳව දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සමඟ **එකඟ වෙමි / එකඟ නොවෙමි.***

2. නිලධාරියාගේ රාජකාරි / හැසිරීම / විශේෂ කුසලතා හා කාර්ය සාධනය ඇගයීමට ලක් කළෙමි. ......................................................... මහතා / මහත්මිය / මෙනවිය **..................... දිනට** ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම **නිර්දේශ කරමි. / නොකරමි.***
(*නිර්දේශ නොකරන්නේනම්, හේතුව කෙටියෙන් සඳහන් කරන්න.)

3. නිවැරදිව, අනූනව සම්පූර්ණ කල **අයදුම්පතද,** එක් එක් කරුණට අදාළ අංකය සටහන් කරමින් අංක පිළිවෙළින් **අදාළ ලේඛන වල සහතික කළ පිටපත් ද අමුණා සකස් කරන ලද ගොනුව මේ සමඟ එවමි.**

දිනය : .................................        .................................

ලේකම්/ප්‍රධාන ලේකම්
............................................... අමාත්‍යාංශය/පළාත් සභාව
නිල මුද්‍රාව